පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - නාට්‍ය හා රංග කලාව

9 ශ්‍රේණිය

02 වන වාරය, ජුලි 01 වන සතිය

සැකසුම -එස්.එස්.සී.ජයසූරිය

Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

# සති පාසල කාර්‍ය පත්‍රිකාව

**1. නිපුණතාව 4.0 :** නාට්‍ය හා රංගකලාව විෂයට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 4.1 :** දේශීය නාට්‍ය කලාවේ ඉතිහාසය හා සබැඳි නාට්‍යයේ අංකුර අවස්ථා අධ්‍යයනය කර එහි ඇති ප්‍රාසාංගික ලක්ෂණ හඳුනා ගනියි.

**පාඩම :** දේශීය නාට්‍යය කලාවේ ඉතිහාසය හා බැඳි නාට්‍යමය අංකුර අවස්ථා අධ්‍යයනය

## 2.ශිෂ්‍යයා විසින් කල යුතු කාර්‍යයන්:

- දේශීය නාට්‍ය කලාවේ ඉතිහාසය හඳුනා ගැනීම.
- දේශීය නාට්‍ය කලාවේ ඉතිහාසය හා බැඳි නාට්‍යමය අංකුර හඳුනා ගැනීම.

- ආලවක දමනය සම්බන්ධයෙන් තොරතුරු එක් රැස් කිරීම.

- පහත දී ඇති ඉගෙනුම් පත්‍රිකා හා අනෙකුත් ඉගෙනුම් ආධාරක ඇසුරෙන් දි ඇති ක්‍රියාකාරකම් සම්පූර්ණ කරන්න.

- පාසල ආරම්භයේදී ඔබගේ අනාවරණයන් පන්තිය ඉදිරියේ ඉදිරිපත් කරන්න.

**3.ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කර ගත හැකි පොත්පත, කියවීම් පත්‍රිකා, Websites සහ ඉගෙනුම් ආධාරක :-**

- **eතක්සලාව -**
  https://www.e-thaksalawa.moe.gov.lk/web/en/

- **eනැණපියස -**
  course : 09 ශ්‍රේණිය නාට්‍ය හා රංගකලාව
  https://enenapiyasa.lk/

# • කියවීම් පත්‍රිකාව -

## බෞද්ධ පූජා කර්ම - I

- බෞද්ධ පූජා කර්ම පිළිබඳ ව අවබෝධ කරවීමේ දී පොත්පත් පරිහරණය කළ නොහැකි සාමාන්‍ය ජනතාවට ධර්මය පිළිබඳ අවබෝධ කර දීම පිණිස විවිධ බෞද්ධ කතා අනුකරනය කිරීම සහ එම කතාවල විවිධ අවස්ථා නිරූපණය කිරීම සඳහා ධර්ම කතික භික්ෂූන් වහන්සේලා ඇතුළු උපාසක පිරිස ක්‍රමවේදයක් අනුගමනය කර ඇත.
- ධර්ම දේශනය අතරමැද කොටස් උපාසකයින් ලවා නිරූපණය කර පෙන්වා ඇත. එමඟින් කතාවේ අර්ථය සේම එහි ඇති ධර්ම කරුණු පිළිබඳව ද පහසුවෙන් අවබෝධ කරවීමට හැකිවිය.

ඒ සඳහා විශේෂ වූ බෞද්ධ ආගමික පූජා කර්ම කිහිපයකි.

1. ආලවක දමනය
2. මිලින්ද ප්‍රශ්නය
3. දොරකඩ හස්න
4. පිරිත් පිංකම

## 1. ආලවක දමනය

අලවුරට පාලනය කළ රජු මුව දඩයමේ ගිය විට ආලවක යක්ෂයා මුණ ගැසුණි. ඔහුගෙන් බේරීම සඳහා දිනපතා දරුවකු බැගින් බිලි දීමට පොරොන්දු වී රජු ආපසු යයි. මෙසේ රජුගේ දරුවා බිලි දීමට දිනය උදා විය. එය දැනගත් බුදුන්වහන්සේ එතනට වැඩම කළහ. බුදුන් දුටු විමානයේ මුරකරු වූ ගද්‍රභ යක්ෂයා උන්වහන්සේ එතනින් ඉවත් කිරීමට බොහෝ වෙහෙසුන ද එය කිරීමට නොහැකි විය. යක්ෂ සමාගමෙන් ආපසු පැමිණි අලවු යකු බුදුන් ඉදිරියේ සැර පරුෂ සේ හැසිරුණි.

උදා:- (ආලවක හා ගද්‍රභ යක්ෂයා අතර සංවාදය)

ගද්‍රභ : මේ විමානයට වැඩියේ ඇයි?
භික්ෂුව : උවමනාවක් නිසා තමයි ආවේ ඔබ ඉඩ දෙනවනම් මම කැමතියි මෙහි රාත්‍රිය ගත කරන්න.
ගද්‍රභ : අනේ ස්වාමීනී, මේක ආලවකයගෙ විමානෙ. ජේතවනය නේද? හැමතැන ම මිනී කාලා ලේයි ඇටකටු ගොඩයි. මෙතන හිටියොත් ඔබ වහන්සේට මොනවා වෙයි ද හිතාගන්න බෑ.
භික්ෂුව : යකාගෙ නපුරුකමින් මට වැඩක් නෑ මම අද මෙතන නවතිනවා.

මේ ආකාරයට යකා පැමිණි පසු ද කතා බහක යෙදෙයි. අවසානයේ දී යකා බණ අසා බුදුන් සරණ යයි. මෙම සිදුවීම සජීවී ප්‍රේක්ෂක පිරිසක් ඉදිරියේ ඉදිරිපත් කරනු ලබන අතර රඟපාන විට පෙන්විය නොහැකි දේ භික්ෂූන් වහන්සේලා විසින් දේශනා කරයි. භික්ෂූන් වහන්සේ විසින් බුදුන් වහන්සේ නියෝජනය කරයි....
මේ අවස්ථාවේ දී පසුබිමින් බෙර වාදනය ඇසේ පන්දම් මගින් ආලෝකය ලබාදෙයි හූ හඬ නගාගෙන කලු රතු ඇඳුම් ඇඳගෙන බෙර වාදනයට අනුව යක්ෂ වෙස් ගත් නළුවන් වේදිකාවට පැමිණේ.

ආලවක දමනය තුළ දැකිය හැකි නාට්‍යමය ලක්ෂණ,

- අනුකරණය - යක්ෂයා ලෙස ගිහියෙක් වෙස්ගෙන පැමිණ රඟ දැක්වීම.
- සමාරෝපය - යක්ෂයා ලෙස ඇඳුම් පැළඳුම් ඇඳ තිබීම.
- බුදුන් ලෙස භික්ෂුවක් පෙනී සිටීම.
- සංවාද භාවිතය - (ගද්‍රභ හා භික්ෂුව අතර සංවාදය)
- රංග භූමිය - පන්සලේ ධර්ම ශාලාව
- ප්‍රේක්ෂකයෝ - (උපාසක උපාසිකාවන්)
- සංගීතය - බෙර වාදනය
- ආලෝකය - පන්දම් එළි භාවිතය
- අංග රචනය - යකෙකු සේ මුහුණ සකස් කිරීම.
- වේෂභූෂණ - යකෙකු ලෙස ඇඳුම් ඇඳීම.
- නළු නිළියෝ - භික්ෂුව හා ගද්‍රභ ලෙස පෙනීසිටි උපාසකයන්
- මෙසේ නාට්‍යයමය අංකුර අවස්ථා ගණනාවක් දැකිය හැකි අතර මෙම පූජා කර්මය තුළ ප්‍රාසාංගික ලක්ෂණ බොහෝමයක් ද දැකිය හැකිය.

**4.මෙම සතියට නියමිත පාඩම මඟින් ආවරණය විය යුතු ඉගෙනුම් ඵල:**

- නාට්‍ය කලාවේ ඉතිහාසය හඳුනා ගැනීම.
- නාට්‍ය කලාවේ ඉතිහාසය හා බැඳි නාට්‍යමය අංකුර හඳුනා ගැනීම.
- ආලවක දමනය නම් නාට්‍යමය අවස්ථාවේ දැකිය හැකි නාට්‍යමය ලක්ෂණ හඳුනා ගැනීම.

**5.ඇගයීම /තක්සේරුකරණ ක්‍රමවේදය හා ආකෘති:**

1. ඔබ දන්නා බෞද්ධ පූජා කර්මය හතරක් ලියන්න.
2. ආලවක දමනය නැමැති පූජා කර්මයට පාදක වූ කතාව කෙටියෙන් ලියා දක්වන්න.
3. එම බෞද්ධ පූජාකර්ම යෙහි පූජා කර්මයෙහි දක්නට ලැබෙන නාට්‍යමය ලක්ෂණ ලියා දක්වන්න.

සැකසුම :- S.S.C ජයසූරිය

ර/නිවි/සිංහලගොඩ විද්‍යාලය